සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

| 64 | S | I |
|---|---|---|

## Sinhala (Second Language) – I

දෙවන බස සිංහල – I

Name :- .................................................... Grade : -................ Index number:-....................

සැලකිය යුතුයි.

- ❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන තෝරා ගන්න.

**Note :**

- ❖ *Answer all questions.*
- ❖ *In each of the questions from 1 to 40 pick one of alternatives (1), (2), (3), (4) which you consider as correct or most appropriate.*

■ **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් ඇති පදය වෙනුවට යෙදිය හැකි සුදුසු පදය තෝරන්න.**

1. **අපිත්තෙක්ක** ඔයත් එනව ද?
   - (1) අපිත් එක්ක
   - (2) අපි එක්ක
   - (3) අපිත්තෙක්ක
   - (4) අපි තේක්ක

2. මල්ලි ක්‍රිකට් සෙල්ලම් කිරීමට **යන්නැද්ද?**
   - (1) යන්න නැද්ද?
   - (2) යන්නෙ නැද්ද?
   - (3) යනවා නැද්ද?
   - (4) යන්නේ නැද්ද?

3. මට අම්මගේ අතින් කෑම **කන්නෝන**
   - (1) කන්න ඕනෙ
   - (2) කන්නෝනේ
   - (3) කන් ඕනෙ
   - (4) කන් ඕනෙ

4. අවුරුදු උත්සවයට **ඔයත්තෙනව ද**?
   - (1) ඔයා එනව ද?
   - (2) ඔයත් එනව ද?
   - (3) ඔයත්තේනව ද?
   - (4) ඔයා එන්නැද්ද?

5. **දෙන්නත්තෙක්ක** සෙල්ලම් කරමු ද?
   - (1) දෙන්න එක්ක
   - (2) දෙන්කෙක් තෙක්ක
   - (3) දෙන්නතේක්ක
   - (4) දෙන්නත් එක්ක

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

**අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතරින් නිවැරදි උච්ඡාරණය සහිත පදය තෝරන්න.**
Select the word with correct pronunciation out of items given in questions from 6 to 10.

6. (1) විස්වාසය (2) විශ්වාසය (3) විස්වාසේ (4) විෂ්වාසය

7. (1) පද්දරය (2) පන්දරය (3) පත්තරය (4) පද්තරය

8. (1) උපදේසය (2) උපදේශය (3) උපදේෂය (4) උපධේෂය

9. (1) තාප්පය (2) තාබ්බය (3) තාබ්පය (4) තබ්බය

10. (1) ස්ථූපය (2) ස්තූපය (3) ශ්තූපය (4) ස්තූඵය

**අංක 11 සිට 14 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න.**
Select the most appropriate and suitable questions for given sentences in questions from 11 to 14.

11. මම කතන්දර පොත් කියවීම.
(1) ඔයාගේ විනෝදාංශය මොකක් ද? (2) ඔයාගේ විනෝදාංශය කීය ද?
(3) ඔයාගේ විනෝදාංශය කොහොම ද? (4) ඔයාගේ විනෝදාංශය කොහේ ද?

12. මම හවස හයට එනවා.
(1) ඔයා එන්නේ කීයට ද? (2) ඔයා එනවා කීයට ද?
(3) ඔයාට එන්නේ කීයට ද? (4) ඔයත් එන්නේ කීයට ද?

13. තාත්තා රෑ දොළහට එනවා.
(1) තාත්තා ගෙදර එන්නේ කොහොම ද? (2) තාත්තා ගෙදර එන්නේ කීයට ද?
(3) තාත්තා ගෙදර එන්නේ මොකේ ද? (4) තාත්තා ගෙදර එන්නේ මොකට ද?

14. ගුරුතුමී ගෙදර වැඩ පරීක්ෂා කරනවා.
(1) ගුරුතුමී කරන්නේ මොකක් ද? (2) ගුරුතුමී කරන්නේ කොහොම ද?
(3) ගුරුතුමී කරන්නේ ඇයි? (4) ගුරුතුමී කරන්නේ කොහේ ද?

**අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදිව අකුරු යෙදී ඇති පදය තෝරන්න.**
Select the word with correct spelling in questions from 15 to 17.

15. (1) ප්‍රදර්ෂනය (2) ප්‍රදර්ශනය (3) ප්‍රදර්ශණය (4) ප්‍රදර්ෂණය

16. (1) ශබ්ධය (2) ශබ්දය (3) සබ්දය (4) ශබ්දය

17. (1) විශාල (2) විසාල (3) විහාල (4) විශාළ

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

■ **අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.**
Select the inappropriate word in questions from 18 to 20.

18. (1) අශ්වයා (2) ගස (3) කුකුළා (4) කන්නේය

19. (1) මුහුණ (2) වත (3) ඇස (4) මුව

20. (1) කුරුල්ලා (2) කුඩුව (3) කුමාරයා (4) පියාපත්

■ **අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න.**
Select the synonym from initially given word in questions from 21 to 23.

21. ව්‍යසනය
(1) වැස්ස (2) ව්‍යාපාරය (3) ව්‍යංගාර්ථ (4) විපත

22. සාගරය
(1) සයුර (2) සසර (3) සංසාරය (4) ක්ෂීර

23. පාට
(1) පැස්ටල් (2) රතු (3) වර්ණ (4) රක්ත

■ **අංක 24, 25 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදය තෝරන්න.**
Select the antonym from initially given word in questions from 24 and 25.

24. ආධුනික
(1) අලුත් (2) ප්‍රවීණ (3) පුහුණුවන (4) නවක

25. සංකීර්ණ
(1) සරල (2) අමාරු (3) අවුල් (4) අපහසු

■ **අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.**
Select the most suitable statement for the picture given in each questions from 26 to 28.

26. 


(1) පොළ පිහිටි ස්ථානය
(2) පෙරේරා ඇන්ඩ් සන්ස් වාහන පමණක්
(3) වාහන නැවැත්විය නොහැක
(4) වාහන නවත්වන ස්ථානය

27. 


(1) වාහනය ඉදිරියට ධාවනය කරන්න
(2) වාහනය පිටුපසට ධාවනය කරන්න
(3) වාහන නවතා තබන්න
(4) වාහන සෙමින් ධාවනය කරන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

28. 


(1) වාහනය නවත්වන්න
(2) වාහනය පෙරළන්න
(3) වාහන ධාවනය කරන්න
(4) වාහන ආපසු රැගෙන යන්න

■ **අංක 29, 30 ප්‍රශ්නවලට යෝග්‍ය පිළිතුරු සපයන්න.**
Five suitable answers for the questions from 29 to 30.

29. පහත සඳහන් පද අතරින් යුගල පදයක් නොවන්නේ,
(1) යන්න එන්න (2) වට පටු
(3) මිළ මුදල් (4) ගොඩ මඩ

30. අනිද්දා සිකුරාදා නම් අද කවදා ද?
(1) ඉරිදා (2) සඳුදා (3) බදාදා (4) අඟහරුවාදා

■ **අංක 31, 32 ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක සම්බන්ධ කර එක වාක්‍යයක් ලෙස නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරන්න.**
Two sentences agre given in each questions 31 and 32. Select the correct sentence that combine both separate sentences.

31. මම පොත ගත්තෙමි. සටහන ලිව්වෙමි.
(1) මම පොතේ සටහන ලිව්වෙමි. (2) මම පොත ඉල්ලාගෙන සටහන ලිව්වෙමි.
(3) මම පොත ගෙන සටහන ලිව්වෙමි. (4) මම සටහන ලියන්න පොත ගත්තෙමි.

32. අයියා පොත් ප්‍රදර්ශනයට ගියේ ය. අයියා පොත් ගෙනාවේ ය.
(1) අයියා පොත් ගෙන පොත් ප්‍රදර්ශනයට ගියේ ය.
(2) අයියා පොත් ප්‍රදර්ශනයට යමින් පොත් ගෙනාවේ ය.
(3) අයියා පොත් ප්‍රදර්ශනයට ගොස් පොත් ගෙනාවේ ය.
(4) අයියා පොත් ප්‍රදර්ශනයට පොත් ගෙනාවේ ය.

■ **අංක 33, 34 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**
Select the most suitable word for filling the blanks questions 33 and 34.

33. දරුවෝ .................................. ගරු කරති
(1) ගුරුවරුට (2) ගුරුවරු (3) ගුරුවරුන්ට (4) ගුරුවරුන් විසින්

34. ඉක්මනට දුවලා .................................. අරගන්න.
(1) ගිහින් (2) ගියාට (3) ගියාම (4) ගිය

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

■ **දී ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**

Answer the following question.

35. අපි 2015 දී ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දුන්නෙමු.
    (1) විස්සයි පහළව (2) දෙදහස් පහළොව
    (3) දෙදහස් එකයි පහ (4) විසිදහස් පහළව

■ **අංක 36 සට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

Select the grammatically correct sentences in questions from 36 to 40.

36. (1) අපේ රටේ දරුවෝ දෙමව්පියන්ට ගරු කරති.
    (2) අපේ රටේ දරුවෝ දෙමව්පියෝම ගරු කරති.
    (3) අපේ රටේ දරුවන් දෙමව්පියන්ට ගරු කරති.
    (4) අපේ රටේ දරුවා දෙමව්පියන්ට ගරු කරති.

37. (1) ගංගාවෝ ගලා බසිති. (2) ගංගාවන් ගලා බැස්සේ ය.
    (3) ගංගා ගලා බසින්නී ය. (4) ගංගාවන් ගලා බැස්සේ ය.

38. (1) අම්මා ගමට යන්නහු. (2) අම්මා ගමට යති.
    (3) අම්මා ගමට යන්නේ ය. (4) අම්මා ගමට යන්නී ය.

39. (1) ගව රළ තණ කති. (2) ගව රළ තණ කෑවා ය.
    (3) ගව රළ තණ කයි. (4) ගව රළ තණ කෑවේ ය.

40. (1) කුඹුරුවල ගැහැණු ගොයම් කපති.
    (2) කුඹුරුවල ගැහැණුන් ගොයම් කපති.
    (3) කුඹුරුවල ගැහැණියක් ගොයම් කපති.
    (4) කුඹුරුවල ගැහැණියක ගොයම් කපති.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

| 64 | S | II |
|---|---|---|

## Sinhala (Second Language) – II

දෙවන බස සිංහල – II

Name :- .................................................... Grade : -................ Index number:-....................

<u>සැලකිය යුතුයි.</u>

- I කොටසෙහි 1 හා 2 ප්‍රශ්න ඇතුළුව II කොටසින් එක් ප්‍රශ්නයක් ද, III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න **<u>පහකට පමණක්</u>** උත්තර සපයන්න.

**<u>Note</u>**

- *Answer five questions only 1st and 2nd questions from Part I and one question from the Part II and two questions from Part III.*

### <u>I කොටස</u>

(1) දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් එකක් ගැන වචන 100 ක රචනයක් ලියන්න.

Write an essay of about 100 words on any one of the following topics in accordance with the given guidlines.

(අ) දෙමව්පියන්ට ගරු කරමු.

(1) දෙමව්පියන් යනු කවුරුන්දයි හැඳින්වීම
(2) ඔවුහු සමාජයේ මුහුණදෙන ගැටලු
(3) දෙමව්පියන් රැකබලා ගැනීමේ වැදගත්කම
(4) ඒ සඳහා අපට කළ හැකි දේ
(5) සමාලෝචනය

(ආ) කුරුල්ලෙක් කතා කරයි.

(1) කල්පිත මාතෘකාවක් ලෙස සලකා කරුණු ඉදිරිපත් කිරීම
(2) කුරුල්ලන්ගෙන් අපට හා ලොවට ඇති ප්‍රයෝජන
(3) කුරුල්ලන් මුහුණදෙන ගැටලු
(4) කුරුල්ලන් ආරක්ෂා කිරීමට කළ යුතු දේ
(5) සමාලෝචනය

(ඉ) පොදු දේපළ සුරකිමු.

(1) පොදු දේපළ යනු කුමක්දයි හැඳින්වීම
(2) පොදු දේපළවලින් ඇති ප්‍රයෝජන
(3) පොදු දේපළවලට වන හානි
(4) පොදු දේපළ රැකගැනීමට කළ යුතු දෑ
(5) සමාලෝචනය

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(ඉ) බෝවන රෝගවලින් වැළකෙමු.

(1) බෝවන රෝග යනු කුමක්දැයි හැඳින්වීම

(2) බෝවන රෝගවලින් අපට ඇති බලපෑම

(3) බෝවන රෝග ඇතිවීමට හේතු

(4) මෙම බෝවන රෝගවලින් ඇති වන හානි වළක්වා ගැනීමට කළ යුතු දේ

(5) සමාලෝචනය

(ඊ) දෙවන භාෂාවක් ඉගෙන ගනිමු.

(1) හැඳින්වීම

(2) දෙවන භාෂාවක් ඉගෙන ගැනීමෙන් ප්‍රයෝජන

(3) දෙවන භාෂාවක් ඉගෙන ගත හැකි ආකාර

(4) ඔබ ප්‍රියකරන දෙවන භාෂාව හා එහි ලක්ෂණ

(5) සමාලෝචනය

(2) දී ඇති පින්තූරය බලා ඒ ඇසුරෙන් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න. (අවම වශයෙන් වාක්‍ය 4ක් වත් තිබිය යුතු ය.)

Compose five meaningful sentences with reference to the given picture. (there should be four words meaningfully in the sentences.)



සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

❖ 3 හා 4 යන ප්‍රශ්නවලින් **එකකට පමණක්** උත්තර ලියන්න.
Answer one question from questions No. 3 and 4.

(3) පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

මල් අරගෙන
තෙල් අරගෙන
සුදු ඇඳුමෙන් සැරසීගෙන
ගුරුතුමියනි සාදු කියා
අපි යමු පන්සල්

හිස්වැසුම් ගලවමු
පාවහන් ගලවමු
බෝ මළුවේ ඇවිදිමු
කොළ ටිකත් අහුලමු

මල් අසුන ලස්සනයි
බෝ මළුව ලස්සනයි
පුංචි හිත ලස්සනයි
මේ සැවොම ලස්සනයි

(1) මෙම කවි පන්තියේ ළමුන් යන්නේ කෙහේ ද?
(2) ඔවුන් එහි යන විට රැගෙන යන දේවල් දෙකක් ලියන්න.
(3) 'පුටුව' යන්නට සමාන වචනයක් කවි පෙළෙන් තෝරා ලියන්න.
(4) ළමුන් යන ස්ථානයට ගිය පසු ඔවුන් එහි දී හැසිරිය යුතු ආකාර දෙකක් කවි පෙළෙන් තෝරා ලියන්න.
(5) මෙහි සඳහන් උත්තම පුරුෂ නාම පදයක් සඳහන් කර, එයට ගැළපෙන ක්‍රියා පද තුනක් කවි පන්තියෙන් තෝරා ලියන්න.

(4) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
Answer the given questions with relevant to the following prose text.

අවුරුද්දේ අගටයි අපේ කලා උළෙල පැවැත්වූයේ එයට ගුරුතුමිය අපට කවි, සින්දු කියා දුන්නා ය. මම යාළුවන් සමඟ සතුටින් සූදානම් වූයෙමි. උත්සවට අඳින්න කිරිඅම්මා මට ගවුමක් මහල දුන්නා ය. සීයා මා හට ගෙලේ පළඳින්න මාලයක් සාදා දුන්නේ ය. උත්සවය දවසේ මම වේදිකාවට ගොඩවූයේ ඉතා බයෙන්, සැම දෙනාගේම ඇස් යොමු වූයේ මා වෙතට ය.

(i) අවුරුද්ද අගට යෙදී තිබෙන්නේ මොකක් ද?
(ii) ගුරුතුමී කියලා දුන්නේ මොනවා ද?
(iii) ගවුමක් මහලා දුන්නේ කවුද?
(iv) සීයා දුන්නේ මොනවා ද?
(v) උත්සවය දවසේ බියෙන් ගොඩවූයේ කොහාට ද?

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## III කොටස

- 5 හා 6 ප්‍රශ්න **දෙකටම** උත්තර සපයන්න.
- Answer bothe questions 5 and 6.

(5) ඔබ පාසල මගින් සංවිධානය කරනු ලබන කලා උළෙල 2021-6-15 වැනි දින ප.ව. 1.00 ට පාසලේ ප්‍රධාන ශාලාවේ පැවැත්වේ. එහි ප්‍රධාන අමුත්තා ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂතුමා වන සී.එල්.පී. වීරසිංහ මහතා සහභාගි වීමට නියමිත ය. මෙම තොරතුරු අදාළ කර ගනිමින් කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂතුමාට යැවීමට ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

**නැතහොත්**

**or**

ශාන්තිපුර වැසියන් පානීය ජලය හිඟයෙන් දැඩි ලෙස පීඩා විඳියි. ළිංවල ජලය ද පානයට නුසුදුසු ය. අපිරිසිදු ජලය පානය කිරීමෙන් දරුවෝ ලෙඩ වෙති. ඔවුන්ගේ පාසල් ගමනට ද මෙය බාධාවකි. වැඩිහිටියෝ නිතර නිතර රෝගී වෙති. මේ නිසා ශාන්තිපුරට සුදුසු ජල යෝජනා ක්‍රමයක් ලබා දෙන මෙන් ජලසම්පාදන මණ්ඩලය වෙත කරන ඉල්ලීමක් සහිත රාජකාරී ලිපියක් ලියන්න. ශාන්තිපුර ජල සුරැකීමේ සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතන්න.

(6) පහත දැක්වෙන ඉංග්‍රීසි වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.
Translate the following English sentences into Sinhala.

(i) This uncle has no job.
(ii) Remain silent in the library.
(iii) Who didn't join the class?
(iv) My mother can cook well.
(v) Wash your hands with soap.

**නැතහොත්**

**or**

ඔබ පන්තියේ සිංහල ගුරුතුමිය 'කුමාර රචනය' පොත මිලට ගැනීමට ඔබට උපදෙස් දී ඇත. ඒ සඳහා ඔබ කුඩා පොත් සැලකට ගොස් පොත ගැනීමට විමසුව ද කුමාර රචනය පොත එම වෙළෙඳසැලෙහි නොමැති විය. එබැවින්, එම පොත ඇති තවත් පොත් සැලකට යාම සඳහා කුඩා පොත් සැලෙහි වෙළඳහිමිගෙන් පාර අසන ආකාරය සංවාදයක් ගොඩනගන්න.